# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர்     ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107

මගේ අංකය : LAE/2011/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதி : 2011.02.

TR/2011-14

**සභාපති,**

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.**

**මහත්මයාණෙනි,**

**<u>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011.03.17</u>**

**<u>දිස්ත්‍රික් අවශ්‍යතා සඳහා ඛනිජ තෙල් ගබඩා කර තබා ගැනීම.</u>**

2011.03.17 **දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම තේරීම් භාර නිලධාරීන්ට ඡන්ද විමසීමට පෙර දින ඡන්දපොල කාර්ය මණ්ඩලය ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය දිවයින පුරා පිහිටි ඡන්ද මධ්‍යස්ථාන වෙත යැවීමට හා ඡන්ද විමසීමේ දින ඡන්ද පොළ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පත් කරන ලද සහකාර තේරීම් භාර නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සලසා දීම සඳහාද වාහන විශාල සංඛ්‍යාවක් ධාවනය කරවීමට සිදුවනු ඇත. මෙයට අමතරව ආරක්ෂක සේවාවන් සැපයීම සඳහා පොලිසියටද වාහන විශාල සංඛ්‍යාවක් ධාවනයෙහි යෙදවීමට සිදුවනු ඇත. මේ තත්වය අනුව මෙම දින කිහිපය තුල වාහන විශාල ප්‍රමාණයක් ධාවනයෙහි යෙදවීමට සිදුවන හෙයින් ඒ සඳහා පෙට්‍රල්,ඩීසල් හා ලිහිසි තෙල් ද විශාල ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇත.**

02. **එහෙයින් හිඟයකින් තොරව මෙම වාහන සඳහා අවශ්‍ය ඉන්ධන ලබා ගැනීමේ හැකියාව සහතික කිරීම පිණිස ඡන්ද විමසීම දිනයට සතියකට පමණ පෙර කාලසීමාවක සිට හා ඡන්ද විමසීම නිමවී සතියක පමණ කාලසීමාවක් ගතවන තෙක් දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම් හල්හි හිඟයකින් තොරව ප්‍රමාණවත් පරිදි ඉන්ධන තොග පවත්වාගෙන යන බවට සහතික වීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් යෙදීමට කටයුතු කරන මෙන් ඔබට කාරුණිකව දන්වමි.**

03. **මෙම දෙපාර්තමේන්තුවේ ඉල්ලීම් පරිදි පසුගිය ඡන්ද විමසීම් වලදී දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල්හි ප්‍රමාණවත් පරිදි ඉන්ධන ගබඩා කර තබා ගැනීමට අවශ්‍ය කටයුතු යෙදීම පිළිබඳව ඔබට බෙහෙවින් කෘතඥ වෙමි.**

04. **මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සලකමි.**

මෙයට - විශ්වාසී,

**දයානන්ද දිසානායක,**

**මැතිවරණ කොමසාරිස්.**

**පිටපත** : සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් හා නියෝජ්‍ය/
ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත - දැනගැනීම සඳහා.

TR-11-14